# කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

ආසියානු සංවර්ධන බැංකු මූල්‍යනය මත ක්‍රියාත්මක කෙරෙන

**ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන හදිසි ප්‍රතිසාධන ආධාර ව්‍යාපෘතිය**

## හැඳින්වීම

ආහාර සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම හා දිළිඳුකමින් පෙළෙන හා අවදානම් තත්ත්වයේ සිටින කණ්ඩායම්වල (විශේෂයෙන් කාන්තාවන් හා දරුවන්ගේ) ජීවන තත්ත්වය නංවාලීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

ඒ අනුව, ව්‍යාපෘතිය ප්‍රධාන උපායමාර්ග 03ක් යටතේ ක්‍රියාත්මක වේ.

1. දිළිඳු හා අවදානම් තත්ත්වයෙන් පෙළෙන ප්‍රජාව වෙත සෘජු මූල්‍ය ආධාර සැපයීම හා එය ප්‍රවර්ධනය කිරීම.
2. දිළිඳු හා අවදානම් තත්ත්වයෙන් පෙළෙන ප්‍රජාව සඳහා ජීවනෝපාය සංවර්ධන සහාය ලබාදීම.
3. සමාජ ආරක්ෂණ පද්ධතීන් හි ඵලදායී බව හා ඔරොත්තු දීමේ හැකියාව (Resilience) වර්ධනය කිරීම.

## ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම්

1. දිළිඳු හා අවදානම් තත්ත්වයෙන් පෙළෙන ප්‍රජාව වෙත මූල්‍ය ආධාර ලබාදීම. (Cash transfers)
    - සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා දීමනාවක් ලබාදීම.
    - වයස අවු. 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා දීමනාවක් ලබාදීම.
    - වයස අවු. 100ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා දීමනාවක් ලබාදීම.
    - ආබාධ සහිත පුද්ගලයින් සඳහා දීමනාවක් ලබාදීම.
    - වකුගඩු රෝගයෙන් පෙළෙන පුද්ගලයින් සඳහා දීමනාවක් ලබාදීම.
    - ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා අතිරේක පෝෂණ දීමනාවක් ලබාදීම.
2. දිළිඳු හා අවදානම් තත්ත්වයෙන් පෙළෙන ප්‍රජාව සඳහා ජීවනෝපාය සංවර්ධන සහාය සැපයීම.
3. ව්‍යාපෘතියට අදාල පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය
4. ආයතනගත දරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීම සඳහා සහාය ලබා දීම හා පහසුකම් අඩු ළමා නිවාසයන්හි භෞතික පහසුකම් සංවර්ධනය .
5. තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථානයන්හි රැඳී සිටින කාන්තාවන් සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබාදීමට සහාය වීම සහ එම මධ්‍යස්ථානයන්හි භෞතික පහසුකම් සංවර්ධනය.

6. ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි හා තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථානයන්හි කාර්යමණ්ඩලය හා ළමා හා කාන්තා සංවර්ධන ක්ෂේත්‍රයේ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම.
7. අවදානම් සහගත දරුවන් හා කාන්තාවන් සඳහා ආරක්ෂණ සැලසුම්/ ජීවනෝපාය සංවර්ධන සැලසුම් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
8. රැකවරණ නිවාසගතවීමේ අවදානමක් පවතින බවට හඳුනාගත් දරුවන් සඳහා මූල්‍යමය සහාය ලබාදීම (එක් වරක් ගෙවනු ලබන දීමනාවකි).
9. ළමා නිවාසගත යෞවනයන් ඇතුළුව අවදානම් සහගත තත්ත්වයේ සිටින යෞවනයන් හා තරුණ කාන්තාවන් සඳහා ජීවනෝපාය සංවර්ධන ආධාර ලබාදීම හා වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා අවශ්‍ය වන පහසුකම් සංවර්ධනය.
10. ග්‍රාමීය ප්‍රදේශයන්හි අඩු ආදායම්ලාභී කාන්තාවන් හා ගෘහස්ථ හිංසනයට ලක්ව නිවාසගතව සිටින කාන්තාවන් සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ආධාර ලබාදීම.
11. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කොටගත් හිංසනයන්ගෙන් හා ගෘහස්ථ හිංසනයන්ගෙන් වින්දිතභාවයට පත්ව ඇති කාන්තාවන් යොමුගත කිරීමේ යාන්ත්‍රණය (දිස්ත්‍රික් මට්ටමින්) ශක්තිමත් කිරීම.
12. මනෝසමාජයීය උපදේශනය පිළිබඳ ධාරිතා සංවර්ධනය.
13. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කොටගත් හිංසනයන් හා ගෘහස්ථ හිංසනයන් අවම කිරීම/ වැළැක්වීම හා නීති ආධාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
14. ඉලක්කගත කාන්තා කණ්ඩායම් සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ආධාර ලබාදීම (කුඩා පරිමාණ කාන්තා ව්‍යවසායිකාවන්, කෘෂිකර්මාන්තයේ නිරත වී සිටින කාන්තාවන්, අඩු ආදායම්ලාභී තනි මව්වරුන් හා ධීවර ක්ෂේත්‍රයේ නිරතව සිටින අඩු ආදායම්ලාභී කාන්තාවන්)
15. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතීන් තුළින් ආධාර ලබා දුන් කාන්තාවන්, දරුවන්, යෞවනයන් හා අවාසිදායක තත්ත්වයේ සිටින පුද්ගලයින් ලද කෙටිකාලීන ප්‍රතිලාභ පිළිබඳ තක්සේරුවක් සිදුකිරීම.
16. වැඩිහිටි නිවාසයන්හි හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන් වෙත සූර්ය ශක්ති විදුලි උත්පාදන පැනල සැපයීම.
17. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා අවශ්‍ය වන මූලික පහසුකම් ලබාදීම.
18. සවිබල ගැන්වීමේ ක්‍රමවේදය (Graduation Approach) ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ගෝපදේශ සකස් කිරීම හා නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

අමාත්‍යාංශයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, , ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, හා සංවර්ධන අංශය හරහා මෙම කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

සමස්ත ව්‍යාපෘතියේ අධීක්ෂණය හා මෙහෙයවීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් ස්ථාපිත කර ඇත.
(Project Implementation Unit)